# ලෝරි ගැසටියර් තුළින් හෙළිවන 19 වන සියවසේ උඩරට ප්‍රදේශවල ආර්ථික හා සමාජීය තත්ත්වය පිළිබඳ අධ්‍යයනයක්

ඩබ්ලිව්.ජී.ටී.යූ වික්‍රමසිංහ
ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
umeshiwickramasinghe85@gmail'com

1815 බ්‍රිතාන්‍යයන් උඩරට යටත් කරගත් පසු එම පළාත් පාලනය කිරීම සඳහා උඩරට නීති රීති, ආයතන හා සංස්ථා පිළිබඳ අවබෝධයක් ලබාගැනීමට ඔවුන්ට සිදු විය. එබැවින් බ්‍රිතාන්‍ය පරිපාලන නිලධාරීන් රැසක් විසින් ශ්‍රී ලංකාව හා උඩරට රාජධානිය පිළිබඳව වාර්තා සම්පාදනය කොට ඇත. ඒ අතුරින් 1873 - 1892 දක්වා මධ්‍යම පළාතේ දිස්ත්‍රික් නඩුකාරවරයා මෙන්ම, ශ්‍රේෂ්ඨාධිකරණයේ ජ්‍යෙෂ්ඨ විනිසුරුවරයෙකු ලෙස කටයුතු කළ ආචිබෝල්ඩ් කැම්බල් ලෝරි මහතා විසින් රචනා කරන ලද *'GAZETTEER OF THE CENTRAL PROVINCE OF CEYLONE* නමැති වෙළුම් දෙකකින් යුත් කෘතිය මෙම පර්යේෂණය සඳහා භාවිත කරනු ලබන ප්‍රධානතම මූලාශ්‍රය යි. 19 වන සියවසේ උඩරට ආර්ථික හා සමාජීය ඉතිහාසය ගොඩනැගීමෙහිලා මෙකී *ලෝරි ගැසටියර්* කෘතියේ මූලාශ්‍රමය වැදගත්කම කෙතෙක් ද? යන්න පරීක්ෂා කිරීම පර්යේෂණ අරමුණු වේ.

පුස්තකාල භාවිතය දත්ත රැස්කරන ලද ප්‍රධාන පර්යේෂණ ක්‍රමවේදය යි. ඒ අනුව, ලෝරි ගැසටියර් හා සමකාලීන ප්‍රාථමික මූලාශ්‍රය අධ්‍යයනය කරමින් අපේක්ෂිත අරමුණු සාක්ෂාත් කරගැනීමටත් අපේක්ෂා කෙරිණි. මධ්‍යම පළාතට අයත් මහනුවර, මාතලේ සහ නුවරඑළිය යන දිස්ත්‍රික්කවල සියලුම ග්‍රාමයන්හි විස්තර ඇතුළත්ව සකස් කෙරුණු වාර්තා සමූහය ලෝරි අත්පිටපත් සමූහයේ අන්තර්ගත වේ. ඉඩම් භුක්තිය හා බැඳුණු සාම්ප්‍රදායික උඩරට වැඩවසම් ක්‍රමය, උඩරට ආර්ථික, සමාජීය, පරිපාලන තන්ත්‍රයේ පදනම වූ බව පැහැදිලි වේ.රාජකාරී ක්‍රමය, ඉඩම් බුක්ති ක්‍රමය කෘෂි කර්මාන්තය හා විවිධ කර්මාන්ත, වාරි කර්මාන්ත හා ජල මූලාශ්‍ර ආදී ආර්ථික තොරතුරුද, කුල ක්‍රමය, ගම්මානවල ප්‍රධානීන් හා නිලතල ක්‍රමය, ඉඩකඩම් පැවරීම ලියාපදිංචිය, එක් එක් ගම්මානවල ජනගහනය සහ විවිධ ජනවර්ග, පන්සල් දේවාල වැනි පූජනීස ස්ථාන, පාසල් ගිලන්හල් ආදී ස්ථාන, ප්‍රාදේශීය වලව් පිළිබඳ, ඥාති සබඳතා, ඉඩම් භුක්තිය, නින්දගම්, පංගු ක්‍රමය, නිල භුක්ති ක්‍රමය ආදී සමාජීය තොරතුරු මෙහි අන්තර්ගත වේ. සමකාලීන ප්‍රාථමික මූලාශ්‍රයන් හා සසඳමින්, 19 වන සියවසේ උඩරට ආර්ථික හා සමාජීය ඉතිහාසය ගැඹුරින් අධ්‍යයනය කිරීමේ දී ලෝරි ගැසටියර් ඓතිහාසික මූලාශ්‍රයක් වශයෙන් ප්‍රබල මූලාශ්‍රමය දායකත්වයක් ලබාදෙන්නේ ය යන්න නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පද :** උඩරට රාජධානිය; ලෝරි ගැසටියර්; මධ්‍යම පළාත ; ඓතිහාසික මූලාශ්‍රය